# නීති රීති වලින් පමණක් අපේ පැරණි ජන උරුමය රැකිය හැකි නොවේ



පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්

## ආචාර්ය සිරාන් දරණියගල

පැරණි මානවයා විසින් නිර්මාණය කරන ලද හෝ භාවිතා කරන ලද දේවල අවශේෂ අධ්‍යයනය කිරීම නැතහොත් ඒවා පිළිබඳ ඉගෙනීම පුරා විද්‍යාව යනුවෙන් ඉතා කෙටියෙන් හඳුන්වා දිය හැකි ය. පැරණි මානව සමාජයේ සිතුම් පැතුම් ඇදහිලි මෙන් ම ආර්ථික, සාමාජීක හා අනෙකුත් සිරිත් විරිත් පිළිබඳව ද මේ අවශේෂ වලින් ඉගෙනීමට හැකි ය. අද පුරා විද්‍යා විෂය විද්‍යාත්මක දියුණුවත් සමග ඉතා දියුණු තත්වයකට පත් වී ඇති මෙවන් යුගයක දී අපගේ පැරණි උරුමය රැකගන්නේ කෙසේද යන ප්‍රශ්නයට අද අප මුහුණ පා සිටින්නෙමු.

අද අප රටේ පුරාවස්තු අපගේ පැරණි මුතුන් මිත්තන් විසින් සිය පත සේ යුගයෙන් යුගයට ආරක්ෂා කළේ නැත්නම් අපට අද දක්නට ලැබෙන්නේ පැරණි ගල් ලෙන් පමණක් විය හැකි ය. එහෙත් වාසනාවකට මෙන් අදත් අනුරාධපුරයේ එදා දේවානම්පියතිස්ස රජු ගේ කාලයේ පටන් ගොඩනගන ලද ආගමික ගොඩනැගිලි එම ස්වරූපයෙන් නොවූවත් එදා ඉදි කළ එම ස්ථානවල ම පිහිටා ඇති බව අපේ පැරණි වංසකතාවල සඳහන් කරුණු වලින් ද විවිධ සෙල්ලිපි හා ඒ ආශ්‍රිත ලිපි ලේඛන හා පුරාවිද්‍යාත්මක සාක්ෂි වලින් පැහැදිලි වේ. අප රටේ මෙන් අඛණ්ඩව නිරවුල්ව ආදි කාලයේ සිට ලියැවුණු ඉතිහාසයක් අසල්වැසි භාරත දේශයටවත් නැත. එම ඓතිහාසික ග්‍රන්ථ සමූහයත් සෙල්ලිපි හා පුරාවස්තු වලින් කියැවෙන කතාව අනුව පමණක් නොව විද්‍යාත්මක පර්යේෂණ කැනීම් අනුව ද අපගේ යටගියාව පිළිබඳ මහාවංශ දීපවංස ආදී ඓතිහාසික ග්‍රන්ථවල පවා නොමැති මෙරට පැරණි ශිෂ්ටාචාරය පිළිබඳව අද තොරතුරු අනාවරණය කළ හැකිව ඇත. එය සැබවින් ම අප රට ලද භාග්‍යයක් සේ සැලකිය යුතුව ඇත.

භාරතයේ මගධ අධිරාජ්‍යය උච්චතම අවස්ථාවට ගෙන ගිය මහා අධිරාජයෙකු වූ අසෝක රාජ යුගයේ දී ලංකාවට පැමිණි මිහිඳු මහ රහතන් වහන්සේ ගෙන් පසුව අපගේ ඓතිහාසික යුගය ආරම්භ වූ බව මෙතෙක් පැවති මතය අප විසින් 1984 දී අනුරාධපුරයේ ගෙඩිගේ නැමති පුරාවිද්‍යාත්මක ස්ථානයේ කරන ලද පර්යේෂණ කැනීම් වලින් සොයා ගන්නා ලද පුරා විද්‍යා දත්ත මගින් පැහැදලි කළ හැකිව ඇත. ඒ අනුව එම ස්ථානයේ දැන් ඇති බිමට අඩි 30 ක් පමණ යටින් ඇති පුරාවිද්‍යාත්මක ස්තර වලින් මතු වූ පුරා විද්‍යා දත්ත අනුව මිහිඳු මහ රහතන්වහන්සේ ලංකාවට වැඩම කරවීමට කලින් හෙවත් දේවානම්පියතිස්ස රාජ යුගය පූර්වයෙන් (ක්‍රිස්තු පූර්ව තුන්වැනි සියවසට කලින්) වසර හයසීයකට පූර්ව කාලයේ දී එනම් ක්‍රිස්තු පූර්ව 900 – 800 පැරණි ශිෂ්ටාචාරයක නටබුන් හමු වූයේ ය. මහාවංසයේ සඳහන් වන විජයාවතරණයට වසර තුන්හාර සියයකට ඉහත කාලය එම යුගයට අයත් වන බව විද්‍යාත්මක කාලනිර්ණය අනුව අද ප්‍රකාශ කළ හැකිව ඇත. එපමණක් ද නොවේ ඒ යුගයේ දී යකඩ තාක්ෂණය පැවති බවත් වී ගොවිතැන අශ්වයින් ඇති කිරීම හා ඉතා දියුණු මැටි බඳුන් භාවිතය ද තිබුණු බවට අපගේ එම ගෙඩිගේ පර්යේෂණ කැනීම් වලින් සොයා ගැනීමට ලැබුණි. එම කැණීම් වලින් අසෝක අධිරාජයට පූර්ණ කාලයට අයත් සේ සැලකෙන පූර්ණ බ්‍රාහ්මී අක්ෂර සහිත වූ වලං කැබලි ද හමු වී ඇත. එම අක්ෂ සහිත වලං කැබලි ක්‍රිස්තු පූර්ව 6 – 5 යන සියවස්වලට අයත් බව එම ස්තර පිළිබඳ විද්‍යාත්මක දින නියමයන් අනුව කිව හැකි ය. එම වලං කැබැල්ලක "අනුරද" යන වචනය ද බ්‍රාහ්මී අක්ෂරයෙන් ලියා තිබී හමු වී ඇත. මේවා මහාවංසයේ සඳහන් විජයාවතරණය ඇතුළු උතුරු ඉන්දියානු බලපෑම් වූ යුගයට අයත් සේ සැලකේ. මේ අනුව එම සියවස් දෙකේ දී ඉතා දියුණු සංස්කෘතියක් පැවති බවට කිසිදු සැකයක් නැත.

ඒ පර්යේෂණ කැණීම් අනුව ලංකාවේ ඓතිහාසික යුගය ආරම්භ වන්නේ දේවානම් පියතිස්ස රාජ යුගයෙන් නොව අඩුම වශයෙන් වසර දෙසිය පණහකට පමණවත් පෙර කාලයේ දී බව කිව හැකි ය. මෙවැනි නිශ්චිත පැරණි ඉතිහාසයක් ශ්‍රී ලංකාවෙන් හමුවීමත්, වෙනත් දකුණු ආසියානු රටක මේ දක්වා දක්නට නොලැබීමත් මෙහි දී විශේෂත්වයකි. ආචාර්ය එෆ්.ආර්. ඕල්මින් මහතා ගේ පර්යේෂණ අනුව අනුරාධපුරයේ "ඇතුළු පුර" ඓතිහාසික මුල් යුගයට අයත් ඉන්දියානු කලාපයේ පස්වැනි නගරය වශයෙන් සැලකේ. ඒ පැරණි අනුරාධපුරය වැනි පැරණි නගරයක් හා සැසඳිය හැකි උජ්ජේනි නගරයට දකුණින් දකුණු ඉන්දියාවේ පවා මෙතෙක් හමු වී නැත. දැනටමත් මෙම පර්යේෂණ කැණීම් තවදුරටත් මාගේ අධීක්ෂණය යටතේ සිදු කෙරෙමින් පවතින අතර ඉදිරි කාලයේ දී මේ පිළිබඳ තවත් පුරාවිද්‍යාත්මක තොරතුරු ලබා ගැනීමට හැකිවෙතැයි විශ්වාස කරමි.

> *භාරතයේ මගධ අධිරාජ්‍යය උච්චතම අවස්ථාවට ගෙන ගිය මහා අධිරාජයෙකු වූ අසෝක රාජ යුගයේ දී ලංකාවට පැමිණි මිහිඳු මහ රහතන් වහන්සේ ගෙන් පසුව අපගේ ඓතිහාසික යුගය ආරම්භ වූ බව මෙතෙක් පැවති මතය අප විසින් 1984 දී අනුරාධපුරයේ ගෙඩිගේ නැමති පුරාවිද්‍යාත්මක ස්ථානයේ කරන ලද පර්යේෂණ කැනීම් වලින් සොයා ගන්නා ලද පුරා විද්‍යා දත්ත මගින් පැහැදලි කළ හැකිව ඇත.*